# මුස්ලිම් ප්‍රජාවගේ අධ්‍යාපනය සහ සමාජ සංවර්ධනය

එම්.එම්.එස්.ජ්. මාරසිංහ
සහකාර කථිකාචාර්ය
භූගෝල අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

## සංක්ෂිප්තය

අතීතයේ සිටම මුස්ලිම් වරු වෙළඳාම සඳහා විවිධ රටවලට සංක්‍රමණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වන විට ඔවුන් විවිධ රටවල සුළු ජාතීන් කොටසක් බවට පත්වී ඇත. ශ්‍රී ලංකාව තුලද මෙම තත්ත්වය දැකිය හැකිය. වෙළඳ ජාතීන් කොටසක් වන මොවුන් අධ්‍යාපනය කෙරේ දැක්වූයේ අඩු අවධානයකි. ඔවුන්ගේ පාරම්පරික ජීවනෝපාය වූයේ වෙළඳාමයි. නමුත් වර්තමානයේදී මොවුන් ක්‍රමයෙන් වෙළඳාමෙන් ඈත්වීමක්ද අධ්‍යාපනය කෙරේ යොමුවීමක්ද දක්නට ලැබේ. මෙලෙස පාරම්පරික ජීවනෝපායෙන් ක්‍රමයෙන් ඈත්වීමට අධ්‍යාපනය කෙතරම් දුරට හේතු වීද යන්න සොයා බැලිය යුතුය. ඒ වගේම අධ්‍යාපන මට්ටමත් සමඟ ඔවුන් තුළ ඇතිවී ඇති සමාජ සංවර්ධනය පිළිබඳ සොයා බැලීමද මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වේ. මේ අධ්‍යයනය සඳහා මාවනැල්ල කොට්ඨාශයේ හිඟුල් ඔය ග්‍රාම නිළධාරි වසම තෝරා ගන්නා ලද අතර සසම්භාවී නියැදි ක්‍රමය අනුව පවුල් ඒකක වලින් 5% ක නියැදියක් තෝරාගන්නා ලදි.

මෙම අධ්‍යයනයට අනුව හිඟුල් ඔය ග්‍රාම නිළධාරි වසම තුළ මුස්ලිම් වරුන්ගේ අධ්‍යාපන මට්ටම ඉතා ඉහල මට්ටමක් ගෙන තිබිණි. නියැදි ප්‍රමාණයෙන් 54% ක් ද්විතීය අධ්‍යාපනය ලබා තිබූ අතර තෘතීයික අධ්‍යාපනය ලැබූ අය ගත් විට 6% කි. එමෙන්ම ඔවුන් රජයේ විවිධ වෘත්තීන්හි නියැලීමක්ද දක්නට ලැබිණි. ඊට අමතරව ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ ඉතා ඉහල මට්ටමක දක්නට ලැබුණ අතර උසස් ජීවන මට්ටමක්ද ඔවුන් විසින් ලඟාකර ගෙන තිබුණි.

ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ. සසම්භාවී නියැදි. සංවර්ධනය